*සැ. යු.* -

- 2023.08.25 දින පළ කරන ලද අංක 2347 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
- මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2023 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,348 - 2023 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2023.09.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 872 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 875 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 සැප්තැම්බර් මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

**මාතර මහා නගර සභාව**

2023 මාතර අප ස්වාමි දුවගේ සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා මාර්ග වසා තැබීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහ නගර සභා ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව, 2017 මාර්තු 03 දිනැති අංක 2009 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ප්‍රසිද්ධියට පත් කරන ලද, මාතර මහා නගර සභාව විසින් වැළඳගන්නා ලද, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් කෙටුම්පත් කර ප්‍රසිද්ධියට පත්කරන ලද අංක 1811 හා 2013 මැයි 17 දින දරන *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ "වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ" 2 වන වගන්තිය ප්‍රකාර ව, මාතර අප ස්වාමි දුවගේ සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය පැවැත්වෙන *2023 සැප්තැම්බර් 08 දින මධ්‍යහ්න 12.00 සිට 2023 සැප්තැම්බර් 10 දින පස්වරු 2.00 දක්වා* මාතර මහජන පොළ අසල මාර්කට් පාර (වෙරළ පාර) සිට මාතර වෙරළ පාරෙ හි අරලිය මාවත දක්වා කොටස, මහාමායා මාවත, සර්වේශස් මාවත සහ අරලිය මාවත රථවාහන ධාවනය සඳහා වසා තබනු ලබන බව මෙයින් නිවේදනය කර ප්‍රසිද්ධ කරමි.

කාංචනා කේ. තල්පාවිල,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2023 අගෝස්තු මස 22 වැනි දා
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

09-50

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**

ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත්කිරීම**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධානවලට අනුකූල ව පහත උපලේඛනවල සඳහන් විගණනය කරන ලද නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත්කරනු ලැබේ.

උපලේඛන I - 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

උපලේඛන II - 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

උපලේඛන I

***2022 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශය***

| | *සටහන්* | *31.12.2021 රු. ශත* | *31.12.2022 රු. ශත* |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ. පිරියත සහ උපකරණ | 6 | 152,422,071.79 | 166,443,030.79 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 7 | 3,226,490.46 | 2,166,912.90 |
| සේවක ණය හා අත්තිකාරම් | 8 | 4,502,911.66 | 5,127,247.66 |

| | සටහන් | *31.12.2021*<br>*රු. ශත* | *31.12.2022*<br>*රු. ශත* |
|---|---|---|---|
| ලැබිය යුතු දෑ | 9 | 37,095,332.84 | 21,186,472.38 |
| ආයෝජන | 10 | 454,677.45 | 4,520,111.84 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 5,030,320.41 | 1,931,937,94 |
| **මුළු වත්කම්** | | **202,731,804.61** | **201,375,713.51** |
| වගකීම් | | | |
| ජංගම නොවන වගකීම් | 12 | - | - |
| ජංගම වගකීම් | 13 | 34,224,970.98 | 19,093,411.99 |
| හිමිකම් | 14 | 168,506,833.63 | 182,282,301.52 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **202,731,804.64** | **201,375,713.51** |

උපලේඛන II

*2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

**මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | *31.12.2021*<br>*රු. ශත* | *31.12.2022*<br>*රු. ශත* |
|---|---|---|---|
| මෙහෙයුම් අයභාරය | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 1 | 32,698,935.51 | 33,861,138.51 |
| වෙනත් අයභාර | 2 | 10,611,629.66 | 10,404,364.28 |
| **මුළු මෙහෙයුම් අයභාරය** | | **43,310,565.17** | **44,265,502.79** |
| මෙහෙයුම් වියදම | | | |
| පුනරාවර්තන වියදම | 3 | 41,382,953.02 | 42,997,506.01 |
| **මුළු මෙහෙයුම් වියදම** | | **41,382,953.02** | **42,997,506.01** |
| **වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය** | | **1,927,612.15** | **1,267,996.78** |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 39,905,063.13 | 1,636,496.65 |
| ප්‍රාග්ධන වියදම් | 5 | 38,966.438.76 | 488,991.21 |
| **වර්ෂය සඳහා වන අතිරික්තය/ඌණතාවය** | | **2,866,236.52** | **2,415,502.22** |

09-14

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.